දිවි තොර කරගැනීම් වාතර්ා කිරීමේදී, සිරස්තල තුළම දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීමත්, එම ආකාරය නැවතත් අන්තගර්තය තුළ ද දීසර ලෙසින් විස්තර කිරීමත් නොකළ යුත්තේ, ඒ ඔස්සේ අනුකාරක සිදුවීම් සඳහා පෙළඹවීම් ඇති විය හැකි බැවිනි.
දිවි තොර කරගැනීමක් ප්රමුඛතාවයෙන් යුතුව පළ කිරීම ඔස්සේ ද එවැනිම ප්රතිඵලයක් අත් විය හැක. එසේම, දිවි තොර කරගැනීමක් සම්බන්ධ පුවතක් සමගින් උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතය ගලවා ගැනීමේ ඉඩක් ලැබෙනු ඇත.
විශේෂයෙන්ම සමාජයේ ප්රකට පුද්ගලයෙකුගේ දිවි තොර කරගැනීමක් සම්බන්ධ පුවත් වාතර්ා කිරීමේදී, මාධ්ය වඩාත් ප්රවේසම් විය යුතු වේ. මන්ද යත්, සාමාන්ය පුද්ගලයන්ගේ දිවි තොර කරගැනීම් වලට වඩා, ජනප්රිය පුද්ගලයින්ගේ දිවි තොර කරගැනීම් වැඩි අවධානයක් ලබා ගැනීමට සහ සමාජයට වඩාත් ඉහළ බලපෑමක් කිරීමට සමත් වීම හේතුවෙනි.
මෙම කියූ කරුණු, දිවි තොර කරගැනීම් වාතර්ා කිරීම සම්බන්ධ මාධ්ය මාගෙර්ාපදේශයන් තුළ සඳහන් වන අතර, දිවි තොර කරගැනීම් වගකීම් රහිතව වාතර්ා කිරීම හරහා, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යාම වැළැක්වීම සඳහා මෙම මාධ්ය මාගෙර්ාපදේශයන් පිළිපදින ලෙසින් Ethics Eye අපි නිරතුරුවම මාධ්යවේදීන්ව දිරිමත් කරන්නෙමු.
"ෆ්රන්ටියර් රිසවර්" නිමර්ාතෘ, ආථර්ික විශේෂඥ අමල් සඳරත්නගේ මරණය සම්බන්ධ කොට ගනිමින් මව්බිම පුවත්පතේ (ජුලි 30, 2023) පළ වූ විශේෂාංග ලිපියක්, විශේෂඥ මනෝ වෛද්ය රූමි රූබන් සමඟ පවා සාකච්ඡා කර පළ කර තිබුණත්, ඉහත දැක්වූ ප්රවේසම් සහගතව දිවි තොර කරගැනීම් වාතර්ා කිරීම සඳහා වන මාධ්ය මාගෙර්ාපදේශයන් එහි පිළිපැදී නොතිබුණි.
මේ අනුව,
1) විශේෂඥ මනෝ වෛද්යවරයකු ගෙන් පවා අදහස් විමසා ඇති මෙම ලිපිය තුළ, හදිසි උපකාරක අංක සඳහන් නොවන්නේ මන්ද?
2) මෙම මව්බිම ලිපිය වගකීම් සහගත මාධ්යකරණයක් යැයි ඔබ සිතන්නේ ද?
උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්රී ලංකා සුමිත්රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්යෙන් සම්බන්ධ කරගත හැක)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!